කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි දෙවන වසර පරීක්ෂණය

දෙවන සෙමෙස්තරය - 2023

**SLG 2231 - සිංහල භාෂා විග්‍රහය**

(කාලය පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. නූතන වාග්විද්‍යා පර්යාලෝකයකින් සිංහල භාෂාව අධ්‍යයනය කළ පුරෝගාමී වාග්විද්‍යාඥයන් දෙදෙනෙකුගේ කාර්ය සනිදර්ශනාත්මක ව ප්‍රමාණ කරන්න.

2. "නූතන වාග්විද්‍යාඥයා මුල්තැන ලබා දෙන්නේ අර්ථයට නොව රූපයට ය." මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව උදාහරණ සහිත ව පරීක්ෂා කරන්න.

3. සිංහල භාෂාවේ ස්වර ශබ්ද විග්‍රහ කර ගැනීම සඳහා නිත්‍ය ස්වර චක්‍රය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

4. සිංහල භාෂාවේ ලිංග භේදය නිරූපණය වන ආකාරය නාම වචන ඇසුරින් විග්‍රහ කරන්න.

5. සර්ග යනු කවර භාෂාත්මක ඒකකයක් දැයි පැහැදිලි කර සිංහල භාෂාවේ සර්ග යෙදෙන ආකාරය විග්‍රහ කරන්න.

6. පහත වාගාලාප ශබ්ද ශික්ෂා සංකේත ආශ්‍රයෙන් ප්‍රතිලේඛනය කරන්න. (එක් එක් වාගාලාපයට නියමිත සම්පූර්ණ ලකුණු ලැබීමට නම් ඒ වාගාලාපයේ සියලු ම සංකේත නිවැරැදි ඒවා විය යුතු ය).

   I. පාරේ ගමන් කරන අය මාර්ග සංඥාවලට අවධානය යොමු කරන්න අවශ්‍යයයි.
   II. ඈත කඳුකර හිමව් අරණේ ගීය ගයන්නේ අමරදේව මාස්ටර්.
   III. දොඩම් හැදෙන කාලෙට ඒවයේ මිල ගොඩක් අඩු වෙනව.
   IV. සාර්ථක නිෂ්පාදකයකු වෙන්න නම් ධෛර්ය සම්පන්නව වැඩ කරන්න ඕනෑ.